කීටාගිරි සූත්‍රය (දෙවෙනි කොටස)
09.09.2018 - ශ්‍රී ලංකාරාමය
නවසීලන්තය

ශ්‍රද්ධාවන්ත පින්වත්නි අපි ඊයේ කථා කරපු සූත්‍ර දේශනාවේ ඉතුරු කොටස මේ වෙලාවේදී සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ තුලින් මේ පින්වතුන්ට ධර්ම කාරණා සමූහයක් හිතන්න අවස්ථාව ලබා දෙනවා. අදත් මේ කියන්නා වූ සූත්‍ර දේශනාවෙන් ඉදිරිපත් වෙන්නා වූ ධර්ම කාරණා ටික ඉතාමත්ම හොඳින් සැම දෙනාටම තේරුම් ගන්න වටහා ගන්න ලැබේවා! සියලු දෙනාටම මේ තුලින් ධර්ම අවබෝධය වේවා! මෙය නිර්වාණ මාර්ගයක් වේවා! අවසානයේදී බුදුරජාණන්වහන්සේ දේශනාකොට වදාලා වූ චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධ කරගෙන අමා මහා නිවනින් සැනසෙන්න ලැබේවා! කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා. මේ ධර්ම කරුණු ටික හැම කෙනාටම හොඳින්ම වටහාගන්න ලැබේවා!

මේ සූත්‍රයට නිධාන කථාවක් තිබෙනවා. බුදුරජාණන්වහන්සේ මේ දේශනාව කරන්නේ කසී රටේ කීටාගිරිය කියන නියම් ගමේ වැඩ ඉන්න කාලයේදී. මේ සූත්‍ර දේශනාවට නමක් ලැබිලා තිබෙන්නේ දේශනා කරපු තැනේ හැටියටයි. සමහර සූත්‍ර දේශනා වලට නම් ලැබිලා තිබෙන්නේ දේශනාව අහන්නා වූ ශ්‍රාවකයාගේ හැටියටයි. 'උදායි සූත්‍රය' වගේ සූත්‍ර. 'ඉසගිලි සූත්‍රය' දේශනා කරන්නේ ඉසගිලි පර්වතය අරමුණු කරගෙන. මේ කීටාගිරි සූත්‍රයේ ආරම්භයට හේතු උනේ බුදුරජාණන්වහන්සේ පැනවූ ශික්ෂාපදයක් පිළිබඳව ධර්ම කාරණයක් මුල් කරගෙනයි. බුදුරජාණන්වහන්සේ භික්ෂූන්වහන්සේලාට ප්‍රකාශ කරනවා, 'මම රාත්‍රී ආහාරයෙන් වැළකිලා ලෙඩ නැතුව පීඩා නැතුව බලවත්ව හොඳින් කටයුතු කරගෙන යනවා, එම නිසා ඔබවහන්සේලාත් එහෙම කරන්න' කියලා සංඝාට පැනවීමක් කළා. සංඝයා ඒක භාර ගත්තා.

භික්ෂූන්වහන්සේලා මේ කථාව කීටාගිරියේ වැඩ හිටපු අස්සජි පුනබ්බසුක දෙනමට කිව්වා. ඒ හාමුදුරුවෝ දෙනම ඒක භාර ගත්තේ නෑ. අස්සජි පුනබ්බසුක දෙනම කිව්වා 'බුදුරජාණන්වහන්සේත් අනිත් භික්ෂූන්වහන්සේලාත් රාත්‍රී ආහාරයෙන් වැළකිලා ලෙඩ නැතුව පහසුවෙන් හිටියට අපි කාල බීලා ලෙඩ නැතුව පහසුවෙන් ඉන්නවා' කියලා. කීටාගිරියේ වැඩ ඉන්න අස්සජි පුනබ්බසුක දෙනම මේ කාරණය පිළිගත්තේ නැති බව භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ දැනුම් දුන්නා. මේ දෙනම ඡබ්බග්ගිය භික්ෂූන්ගේ වහන්සේලාට අයිති දෙනමක්. ඡබ්බග්ගිය භික්ෂූන්ගේ වහන්සේලා කියලා කියන්නේ ඒ අයගේ පවුල් සමග මහණ වෙච්ච හාමුදුරුවෝ 6 දෙනෙක්. මේ අයගෙන් පණ්ඩුක, ලෝහිතක කියන දෙනම හිටියා සැවැත්නුවර මෙත්තිය හා භුම්මජක යන දෙනම හිටියෙ රජගහනුවර. අස්සජී, පුනබ්බසුක දෙනම හිටියේ කීටාගිරියේ.

තවත් එකක් තමයි මේ පින්වතුන්ට මතක් කරන්න ඕනෑ, ඔය පවුල් පිටින් මහණ උනහම මිනිස්සු හරියට පහදිනවා. පැහැදෙන එක හොඳයි, මුලා වෙන එක නරකයි. සමහර අය ගෙවල් අත්හැරලා යනවා. ගිහිල්ලා ස්වාමියා කොහේ හරි ආරාමයක ඉන්නවා. ඒ කිට්ටුවෙන්ම නෝනා මහත්තයා මැණියෝ හදාගන්නවා තව සේනාසනයක්. දරුවොත් ඒ කිට්ටුවෙන්ම ඉන්නවා. තව හිතවත් අයත් එනවා. එහෙම උනහම අපිට 'අනේ මේ සංසාරයේ පතාගෙන ආපු පාරමී ගුණ පුරන්නා වූ බොහෝම ශ්‍රද්ධාවන්ත ගුණවන්ත පුදුම පිරිසක්' කියන හැඟීම ඇතිවෙනවා. මේ කියන්නේ ඔක්කොම ගැන නොවෙයි, සමහර අය ගැන පමණයි. නමුත් ඒ ජීවිත වලට පහදින කොට ඒ අය ඒකෙන් අමාරුවේ වැටෙනවා. පුදුම විදියට මිනිස්සු ඒකට ඇදී යනවා.

මේක ඊර්ෂ්‍යාවට කියන එකක් නොවෙයි. සමහර මිනිස්සු ඊර්ෂ්‍යාව හඳුනන්නෙත් නෑ. මසුරුකම හඳුනන්නෙත් නෑ. ඊර්ෂ්‍යාව කියන්නේ මොකක්ද? ඊර්ෂ්‍යාව කියලා කියන්නේ අනිත් අයගේ සම්පත්වලට අකමැති එක, උහුල්ලන්නේ නැති ගතිය. මේ වගේ බංකොලොත් වැඩ කරන අයට මොන ඊර්ෂ්‍යාවක්ද ඇති වෙන්නේ? මේ ගැන තිබෙන්නේ ඊර්ෂ්‍යාවක් නොවෙයි, ලෝකය මුලා කිරීමක්

පිළිබඳව පිළිකුල් ස්වභාවයක්. ධර්මය විකෘති කරමින් මුලා කරන්නා වූ ස්වභාවයක් මේ අයගේ තිබෙන්නේ. බුද්ධ කාලෙත් ඕක උනා.

බුද්ධ කාලේ අනෝජා දේවිය කියලා දේවියක් හිටියා. අනෝජා දේවියගේ ස්වාමියා මහා කප්පින රජතුමා පිරිසක් සමග මහණ උනා. ඊට පස්සේ අනෝජා දේවිය ඇතුළු පිරිසත් ඇවිල්ලා සාසනයට ඇතුළු උනා. ඒ පිරිස පැවිදි වෙලා ඒ අයගේ ස්වාමිවරු මහණ වෙලා හිටපු සේනාසන ළඟ හිටියේ නෑ. ඒක වෙන ක්‍රමයකට සිදු උනේ. ඒවගේම යසෝදරා දේවිය පැවිදි උනා. මහා ප්‍රජාපතීන් වහන්සේ ඇවිල්ලා පැවිදි උනා. ඒ ඉතාමත් ධර්මානුකූල සුන්දර ශ්‍රමණ ස්වභාවයෙන් නෙක්ඛම්ම ස්වභාවයෙන් පැවිදි වූ අය.

ගිහි බන්දනයෙන් එකට ඉඳලා පැවිදිවෙන සමහර අය නෝනා ඒ කිට්ටුවෙන් මහණ කරගන්නවා. ඊට පස්සේ කුළුපග වෙනවා, පිරිකරවලට ආස කරනවා, මුදල් වලට ආස කරනවා. කුටි වලට රණ්ඩු වෙනවා. ඒ අයගේ නෙක්ඛම්ම අදහස නැති වෙනවා. ඒ අය මහණ උනේ ඇයි කියලා අමතක වෙනවා. අපි මේවා ගැන හොඳට දන්නවා. ඡබ්බග්ගිය භික්ෂූන්වහන්සේලාගේ ස්වභාවයත් ඔන්න ඔය වගේ. ඒ ගොල්ලන්ගෙත් භාර්යාවරු මහණ උනා. ඒ අයත් අමුතු අමුතු ජාතියේ දේවල් කළා.

තවත් එකක් තමයි, අනාගතයේ මේ කවුරුහරි මහත්මයෙක් මහණ වෙනවා නම්, මේ මෑණි කෙනෙක් මහණ වෙනවා නම් මගේ අවවාදය නම් කිසිම දවසක තමන්ගේ කෙනෙක් ළඟ තියා ගන්නනම් එපා, අම්මා හරි තාත්තා හරි අසනීපයක් උනොත් හැර ළඟ තියා ගන්න එපා. නෝනා දසසිල් රකිනවා නම් අනුරාධපුරයේ, හාමුදුරුවන්ට කියන්න මාතර ගිහිල්ලා නවතින්න කියලා. ගාල්ලේ දස සිල් ආරාමයක ඉන්නවා නම් නෝනා, හාමුදුරුවන්ට බුලත් අතක් දීලා කියන්න ඔබ වහන්සේ කරුණාකරලා යාපනයේ ගිහිල්ලා නවතින්න කියලා. ඒකට හේතුව තමයි ළඟ උනහම ප්‍රත්‍යයට ගිජු වෙනවා. මේ කියන්නේ කෙලෙස් සහගත කමම නොවෙයි, හාමුදුරුවන්ට හම්බවෙන ප්‍රත්‍යය දසසිල් ආරාමයට යනවා. දස සිල් ආරාමයට යන ප්‍රත්‍යය හාමුදුරුවන්ට යනවා. ඒක නම් හැබැයි හොඳයි, පිනක් සිද්ධවෙන නිසා. නමුත් නොමනා විදියට පාවිච්චි කරන එක භයානකයි.

මම දන්නා එක හාමුදුරුවෝ කෙනෙකුගේ අම්මා කෙනෙක් හිටියා හරිම ශ්‍රද්ධාවන්තයි. අපිට මතකයි ඒ අම්මා පුදුම විදියට හාමුදුරුවරුන්ට ගරු කරලා ගාථා කියලා වැඳපු අම්ම කෙනෙක්. ඒ අම්මා කාලයකදී අසනීප උනා. ඒ මෑණියන්ගේ පුතා හාමුදුරුවෝ අම්මා ගෙන්නා ගත්තා උපස්ථාන කරන්න කියලා ළඟට. ඒ අම්මට කාමරයක් හදලා දීලා අම්මත් කටයුතු කරගෙන හොඳින් හිටියා. ඒ හොඳට හිටපු අම්මා, හැම හාමුදුරුවෝ කෙනෙකුටම හොඳට සලකපු අම්මා පස්සේ වෙනස් උනා. ටික කාලයක් ඒ පුතා හමුදුරුවන්ගේ ස්ථානයේ ඉන්නකොට මේ අම්මට හිතෙනවා 'මේ අපේ හාමුදුරුවන්ගේ පන්සල' කියලා. ඒ පන්සල ඒ හාමුදුරුවන්ට තිබෙන එකක් නොවෙයි. ඒක සංඝයාට තිබෙන තැනක්. ඒ හාමුදුරුවෝ ඒකෙ ප්‍රධාන කථාව වෙන එකක්. ඒ අම්මට හිතුනා මේ පුටු සිවුරු පිරිකර පිටි සිනි තේකොළ ඔක්කෝම අපේ හාමුදුරුවන්ට හම්බ වෙන ඒවා කියලා. ඒක නිසා අපේ කමක් මගේ කමක් ඇති උනා. අවසානයේදී ඒ අම්මගේ ශ්‍රද්ධාව පිරිහුණා. ඉස්සර හාමුදුරු දැක්කහම දුර ඉඳලම වැඳගෙන ආපු අම්මගේ ඒ ගතිය පස්සේ නැති උනා.

ඒක නිසා මේ අයගෙත් දැනට ඉතුරුවෙලා තිබෙන ශ්‍රද්ධාව ඉතුරු කරගන්න ඕනේ නම් මහණ උනොත් කිසිම කෙනෙක් නෑදෑයෙක් තමන්ගේ ළඟ තියා ගන්න හොඳ නෑ. මාස කීපයකට සැරයක් ගිහිල්ලා දුක සැප බලලා එන එක වෙන කථාවක්. ඒක බුදුරජාණන්වහන්සේත් රාහුල ස්වාමීන්වහන්සේත් භික්ෂුණීන් වහන්සේලාත් කළා. ඒක පොදු ධර්මයක්. ලෙඩක් දුකක් හැදුනහම සිද්ධ වෙන දෙයක් ඒ. ඒක කළයුතු දෙයක්. නමුත් තමන්ගේ අය ළඟට ගෙන්න ගත්තට පස්සේ ඒ ගොල්ලන්ට අමුතු විදියේ ලෝභකමක් ඇතිවෙනවා. මේක මම කියන්නේ ත්‍රිපිටකයේ තිබෙන එකක් හින්දම නොවෙයි, අපේ ජීවිත කාලයේදීම අපි දැකපු එකක් නිසා. ඒක ගලපන්න එක සිද්ධියක් ත්‍රිපිටකයේත් තිබෙනවා.

බුදුරජාණන්වහන්සේගේ කාලයේදී කපිල මත්සායයා කියලා රත්තරන් පාට මාළුවෙක් හිටියා. ඒ මාළුවා කාශ්‍යප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ කාලයේ මහණවෙලා බණ දේශනා කරපු ප්‍රසිද්ධ ධර්ම දේශකයාණන් වහන්සේ කෙනෙක්. ඒ ප්‍රසිද්ධ ධර්ම දේශකයාණන් වහන්සේගේ අම්මා සහ නංගිත් මහණ වෙලා හිටියේ ඒ ස්වාමීන්වහන්සේ වැඩ හිටපු කිට්ටුව ස්ථානයකමයි. ඒ ස්වාමීන්වහන්සේගේ අයියත් මහණ වෙලා හිටියා. අයියා රහත් උනා. කපිල හාමුදුරුවන්ගේ අම්මයි නංගියි දෙන්නා 'මේ අපේ හාමුදුරුවන්ට හම්බ වෙච්ච පිරිකර' කියලා ලෝභකම් කළා.

මහණ වෙනකොට මුලදී තිබුන ශ්‍රද්ධාව ප්‍රත්‍යය නිසා, කීර්තිය නිසා, නම්බුනාම නිසා ඒවාගේම මිනිස්සු සාධු කාර දෙන නිසා නැතිවෙලා යනවා. කෙලෙස් සහගත හිත් නිසා ලාභ සත්කාර වලට යට වෙනවා. ඒක නිසා මහණ උනාට කමක් නෑ, දස සිල් උනාට කමක් නෑ, කිට්ටුව නම් ඉන්න එපා. වෙන කෙලෙස් එනවට නොවෙයි. ඊට වඩා අමාරුයි තමන්ට කිර්ති ප්‍රශංසා ලාභ සාත්කාර එනකොට ඒවා handle කරන්න තරම් ශක්තියක් හයියක් පිරිසට නෑ. ඒක නිසා විනාස වෙනවා.

මේ පණ්ඩුක, ලෝහිතක, මෙත්තිය, භුම්මජක, අස්සජී, පුනබ්බසුක කියන හාමුදුරුවෝ හය දෙනාටත් ඔය සිද්ධිය උනා. සමහර අය නොමනා වැඩ කළා. කීටාගිරියේදී මේ හාමුදුරුවෝ දෙන්නා මුල් කරගෙන බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනාවක් කරනවා භික්ෂුන්වහන්සේලාට. බුදුරජාණන්වහන්සේ අස්සජී පුනබ්බසුක කියන දෙනම ගෙනැල්ලා ඇහුවා "මම පනවපු ශික්ෂාපද භාර ගත්තේ නෑ කියන්නේ ඇත්තද?" කියලා. බුදුරජාණන් වහන්සේ ඉදිරි පිට බොරු කියන්නේ නැති නිසා 'ඇත්ත' කියලා ශික්ෂාපද භාර ගත්තේ නැති බව පිළිගත්තා. ඒ වේලාවේදී බුදුරජාණන්වහන්සේ වේදනාව පිළිබඳව දේශනාවක් කළා. අස්සජී පුනබ්බසුක භික්ෂුණ වහන්සේලා සහ විකාල භෝජනය පිළිබඳ කථාව මේ දේශනයට පාදක වූ නිධානයයි. නමුත් ධර්ම දේශනාව තිබෙන්නේ වෙනත් පැත්තක.

මෙහිදී බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා "මම වේදනාව පිළිබඳව දේශනා කරන්නේ නොදැන නොවෙයි, දැනගෙනයි " කියලා වේදනා තුනක් පිළිබඳව දේශනා කළා. අපි ඊයේ ඒ ගැන කථා කළා. ඒ තමයි 'සුඛ වේදනාව' 'දුක්ඛ වේදනාව' සහ 'උපෙක්ෂා වේදනාව'. අපි මොකක්ද ඒ ගැන කිව්වේ? සුඛ වේදනාව නිසා කුසල් වැඩීමකුත් තිබෙනවා, අකුසල් වැඩීමකුත් තිබෙනවා. දුක්ඛ වේදනාවෙන් කුසල් වැඩීමකුත් තිබෙනවා, අකුසල් වැඩීමකුත් තිබෙනවා. උපේක්ෂා වේදනාවෙන් කුසල් වැඩීමකුත් තිබෙනවා අකුසල් වැඩීමකුත් තිබෙනවා. ඒකයි අපි පරෙස්සම් වෙන්න ඕනේ. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා "මම යම් කිසි කෙනෙක් විඳින්නා වූ සැප වේදනාව, දුක්ඛ වේදනාව සහ උපේක්ෂා වේදනාව නිසා කුසල්ම වැඩෙනවා අකුසල් යට යනවා කියලා දේශනා කරලා නෑ" කියලා. සමහර අයට සැප වේදනාවෙන් කුසල් වැඩෙනවා සමහර අයට අකුසල් වැඩෙනවා. අද අපි එතැන සිට ඉදිරියට සූත්‍ර දේශනාව බලමු.

මේ කාරණය හොඳට හිතේ දරා ගන්න.
බුදුරජාණන්වහන්සේ මෙසේ දේශනා කරනවා

"නාහං, භික්ඛවෙ, සබ්බෙසංයෙව භික්ඛූනං 'අප්පමාදෙන කරණීය'න්ති වදාමි" = "මහණෙනි මම සියලුම භික්ෂුන් වහන්සේලාට අප්‍රමාදීව කටයුතු කරන්න ඕනෑම කියලා කියන්නේ නෑ". මෙසේ නොකියන්නේ රහතන්වහන්සේලාටයි. රහතන්වහන්සේලා එහි පරිපූර්ණත්වයට ගොස් අවසානයි. නමුත් සේඛ භික්ෂූන්වහන්සේලාට අප්‍රමාදීව කටයුතු කරන්න කියලා කියනවා.

"සත්තිමෙ, භික්ඛවෙ, පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ සත්ත? උභතොභාගවිමුත්තො, පඤ්ඤාවිමුත්තො, කායසක්ඛි, දිට්ඨිප්පත්තො, සද්ධාවිමුත්තො, ධම්මානුසාරී, සද්ධානුසාරී.	"මහණෙනි මේ පුද්ගලයෝ හත්දෙනා ලෝකයේ විද්‍යාමාන වෙනවා. ඒ පුද්ගලයෝ හත් දෙනා කවුද? උභතොභාගවිමුත්ත, පඤ්ඤාවිමුත්ත, කායසක්ඛි, දිට්ඨිප්පත්ත, සද්ධාවිමුත්ත, ධම්මානුසාරී, සද්ධානුසාරී.

මේ පුද්ගලයෝ හත්දෙනා අපේ මේ ධර්ම වැඩසටහනට සම්බන්ධවෙන පින්වතුන් දැනගෙන තිබෙන එක හොඳයි.

1) උභතොභාගවිමුත්ත පුද්ගලයා
2) පඤ්ඤාවිමුත්ත පුද්ගලයා
3) කායසක්ඛි පුද්ගලයා
4) දිට්ඨිප්පත්ත පුද්ගලයා
5) සද්ධාවිමුත්ත පුද්ගලයා
6) ධම්මානුසාරී පුද්ගලයා
7) සද්ධානුසාරී පුද්ගලයා

මේක විශේෂ ධර්ම කාරණා ටිකක්. මේ පුද්ගලයන් හත්දෙනා මේ විදියට හත් දෙනෙක් වෙන්න හේතුව තමයි මේ හත් දෙනා තුල තිබෙන වෙනස් කම්. පොදු වශයෙන් ගත්තම මේ පුද්ගලයෝ හත් දෙනාම බුදුහාමුදුරුවන්ගේ ශ්‍රාවක භාවයෙන් එකයි. කායික හැඩරුවෙන් ගත්තම වෙනස්. සමහර හාමුදුරුවරු උසයි. සමහර හාමුදුරුවරු මහතයි. සමහර හාමුදුරුවරු කෙට්ටුයි. සමහර හාමුදුරුවරු මිටියි. කයේ හැටියට වෙනස්. මේ වෙනස දක්වන්නේ කයේ හැඩ රුව අනුව නොවෙයි. වචන කථා කරන්නා වූ වේගය සීමාව අලංකාරත්වය අප්‍රසන්නත්වය අනුවත් නොවෙයි. බුදුරජාණන්වහන්සේ මේ පුද්ගල විවිධත්වය දක්වන්නේ ඒ ශ්‍රාවකයන් වහන්සේලා නිර්වාණ ධාතුවට යන මාර්ගය සහ නිර්වාණය ධාතුවට පත් වෙච්ච විදිය කියන්නා වූ ආධ්‍යාත්මික ධර්ම කාරණා මුල් කරගෙනයි. බාහිරින් මැනීමක් ඒවාගේම ප්‍රමාණය කිරීමක් අනුව නොවෙයි. මේ පුද්ගලයන්ගේ අධ්‍යාත්මික ගුණයන්ගේ තිබෙන්නා වූ අඩු වැඩියාවන් සහ ධර්මයට පත් වෙච්ච විදියෙන් තමයි මේ කියන්නා වූ විවිධත්වය දක්වන්නේ. මේ ශ්‍රාවකයන් පිළිබඳව වෙනස් කම් අපි සූත්‍රය කියවලා දැනගනිමු.

මොකක්ද මේ **උභතොභාගවිමුත්ත** කියලා කියන්නේ? උභතෝකෝටික ප්‍රශ්න කියලා කියනවා. අටෝරාසිය කියලා කියනවා. අටෝරාසිය කියලා කියන්නේ මොකක්ද? අටෝරාසිය කියන්නේ 108. ඒක හැදෙන්නේ මෙහෙමයි.

අට = 8
උර = වැඩිවූ
සීය = සීය (සීයට අටක් වැඩියි කියන්නේ 108 යි.)

අට අනුවක් කියන්නේ 98. පරණ සිංහල භාෂාවේ තිබෙන්නේ අන්තිමට තිබෙන සංඛාව ඉස්සරහට දාල කියන ක්‍රමයක්.

උභතෝකෝටික
උභත = දෙක
කෝටි = කෙළවර

කෙළවරවල් දෙකේම තිබෙන එනම් විසදිය නොහැකි ප්‍රශ්නයකට උභතෝකෝටික ප්‍රශ්නය කියලා කියනවා. මේ සූත්‍රයේ තිබෙන්නේ 'උභතොභාගවිමුත්ත' කියලා. මේ උභතොභාගවිමුත්ත කියන පුද්ගලයා අපි මේ විදියට දැන ගනිමු. මෙතැනදී බුදුරජාණන් වහන්සේ මෙසේ ප්‍රශ්නයක් අහනවා.

''කතමො ච, භික්ඛවෙ, පුග්ගලො උභතොභාගවිමුත්තො?	මහණෙනි, උභතොභාගවිමුත්ත පුද්ගලයා කවුද?

බුදුරජාණන් වහන්සේගේ දේශනාවේ තිබෙනවා **ශාන්ත විමොක්ෂ** කියලා ජාතියක්. ශාන්ත විමොක්ෂය කියලා කියන්නේ **අරූපාවචර ධ්‍යාන සමාපත්ති** වලට**.** ඒ තමයි **ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නේවසඤ්ඤා නා සඤ්ඤායතනය**. ආකාසඤ්චායතනයට

පත්වෙනකොට ඒක ධ්‍යානයක්. මේවා හතරම අරූපාවචර ධ්‍යාන. අරූපාවචරයි කියලා කියන්නේ ඇයි? අරූපාවචරයි කියලා කියන්නේ රූප සංඥාවක්, රූප මනසිකාරයක්, රූප පිළිබඳව හිතීමක්, රූප පිළිබඳව සංඥාවක් හැඟීමක් මොකක්වත් නැති බව. භාවනාවට ගත්ත ආශ්වාස පවා දැනේන්නේ නෑ. ඊට හේතුව ආශ්වාස කියන්නේ 'රූප'. රූප කාණ්ඩයේ තිබෙන්නා වූ 'පඨවි' 'ආපෝ' 'තේජෝ' 'වායෝ' ඇතුළු සියලුම රූප සවභාවයක් අරමුණු කිරීමෙන් අයින් උනහම කිසිම අංශු මාත්‍ර රූපයක් පිළිබඳවවත් සංඥාවක් ඇතිවෙන්නේ නෑ. රූප දැනෙන්නේ නැති ඒ ධ්‍යාන තත්වයට කියනවා **ශාන්ත විමොක්ෂය** කියලා.

ඉධ, භික්ඛවෙ, එකච්චො පුග්ගලො යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ කායෙන ඵුසිත්වා විහරති	මහණෙනි, මේ සාසනයේ සමහර පුද්ගලයෝ යම් කිසි ශාන්ත විමොක්ෂයක් වේද, රූපයන් ඉක්මවා ගියා වූ (**අතික්කම්ම රූපෙ**) ඒ අරූපී වූ ධ්‍යාන ස්වභාව (**ආරුප්පා**) මානසික ධර්ම වලින්, නුවණින් සපර්ෂ කරමින් වාසය කෙරේද, (*කායෙන ඵුසිත්වා)
***පඤ්ඤාය වස්ස දිස්වා**	*ආකාසානඤ්චායතනය,විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය හෝ නේවසඤ්ඤානා සඤ්ඤායතනය යන එම ධ්‍යාන වලින් නැගිටලා අරූපී වූ ධර්ම ස්වභාවයන් සහ ඒවා ස්පර්ශ කරන්නා වූ ඒ චිත්ත චෛතසික ධර්මයන්ද විදර්ශනා කොට ඒ නාම ධර්මයන්ගෙන් මිදෙනවා.
ආසවා පරික්ඛීණා හොන්ති.	ආශ්‍රවයන් ක්ෂය කරනවා,

එකච්චො පුග්ගලො කියලා කියන්නේ කවුද? (එකච්චො = සමහර) සමහර පුද්ගලයෝ කියලා කියන්නේ ඔක්කොම අය නොවෙයි කියන එක.

අතික්කම්ම රූපෙ = රූපයන් ඉක්මවලා යනවා කියන්නේ අජටාකාශයට යන එක නොවෙයි. දැන් කාලේ එහෙමත් කියන්න පුළුවන්, මේ පොළෝ තලයෙන් ඈත් වෙලා වායු ගෝලයෙන් අයින් වෙලා යන එකක් කියලා, නමුත් එහෙම එකක් නොවෙයි. රූප ඉක්මවන්නේ මනසින්. අරූපී ධ්‍යාන වල කිසිම අවස්ථාවකදී රූප අරමුණු කිරීමක් ආලෝක අරමුණු කිරීමක් මොකක්වත් කරන්නේ නෑ. ආලෝක අරමුණු කරන කොටත් රූපයට සම්බන්ධ වෙනවා. ආකාසානඤ්චායතනයේදී අරමුණ අකාසයයි. ආකාසය අරමුණු කරන්නා වූ ධ්‍යාන තත්වයට කියනවා ආකාසානඤ්චායතනය කියලා. ඒක හතරවෙනි ධ්‍යානයෙන් ඉස්සරහට යන එකක්. හතර වෙනි රූපාවචර ධ්‍යානයත් ඉක්මවා ගියහම තමයි ආකාසානඤ්චායතන ධ්‍යානය හම්බ වෙන්නේ. ඒකට සාන්ත විමොක්ෂය කියලා කියනවා. මෙහි තිබෙන ගුණය තමයි රූප ඉක්මවා යෑම = (**අතික්කම්ම රූපෙ**)

* **කායෙන ඵුසිත්වා** කියන්නේ ශරීරයෙන් ස්පර්ශ කරන එක නොවෙයි. ශරීරයටත් 'කය' කියලා කියනවා. 'මානසික ධර්ම වලින්' කියන එකට පාවිච්චි වෙන තවත් වචනයක් තමයි **'කායෙන ඵුසිත්වා'** කියන එක. 'මානසික ධර්ම වලින් ස්පර්ශ කළා' කියන එකයි. මේ කෙනාට මේ වෙනකොට එක විමුක්තියක් තිබෙනවා. අරූපාවචර භාවනාව වඩලා එයා ඉස්සෙල්ලා එයා රූප වලින් මිදුනා. මෙයාට රූප සම්බන්ධයෙන් මෙනෙහි කරන්න දෙයක් දැන් නෑ. එයා දැන් ඒ ධ්‍යාන තත්වය ස්පර්ශ කරන්නේ නුවණින්.

* **පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති** = ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නේවසඤ්ඤා නා සඤ්ඤායතනය යන ධ්‍යාන වලින් කෙනෙක් නැගිටලා එයා ඒ අරූපී වූ නාම ධර්ම මෙනෙහි කරනවා. (චිත්ත චෛතසික ධර්ම = චේතනාව, ඵස්සය, වේදනාව, සංඥාව, ශ්‍රද්ධාව ආදී ධර්ම) **'පඤ්ඤාය චස්ස දිස්වා'** කියලා කියන්නේ මේ නාම ධර්මවල තිබෙන අනිත්‍යයත්වය දුක්ඛත්වය අනාත්මත්වය මෙනෙහි කරනවා. මෙහෙම බලලා එයා නාම ස්වභාවයන්ගෙන් මිදෙනවා.

1) අරූපාවචර භාවනාවෙන් රූපයෙන් මිදෙනවා.

2) විපස්සනා භාවනාවෙන් නාමයෙන් මිදෙනවා.

මේ අයුරින් මේ පුද්ගලයා දෙපැත්තකින්ම මිදුනා. ඒ කියන්නේ **උභතොභාගවිමුත්තයි.** රහත් භාවයට පත් උනා. මේ පුද්ගලයා ඉස්සෙල්ලා නැති කළේ රූපය. ඊළඟට නැතිකළේ නාමයට තිබෙන බැඳීම.

අයං වුච්චති, භික්ඛවෙ, පුග්ගලො උභතොභාගවිමුත්තො **ඉමස්ස බො අහං, භික්ඛවෙ, භික්ඛුනො** **'න අප්පමාදෙන කරණීය'න්ති වදාමි.** **තං කිස්ස හෙතු?** **කතං තස්ස අප්පමාදෙන.** **අභබ්බො සො පමජ්ජිතුං.**	මහණෙනි මේ පුද්ගලයාට කියනවා උභතෝභාග විමුත්ත කියලා. මෙන්න මේ උභතොභාගවිමුත්ත භික්ෂුන් වහන්සේට බුදුරජාණන් වහන්සේ අප්‍රමාදී වෙන්න කියලා කියන්නේ නෑ. ඒකට හේතුව කුමක්ද? ඒ භික්ෂුන්වහන්සේ අප්‍රමාදීව කළ යුතු සියල්ල කරලා ඉවරයි. එම භික්ෂුන්වහන්සේ ප්‍රමාද වීමට සුදුසු භික්ෂුන් වහන්සේ කෙනෙක් නොවෙයි. ඔහු රහතන්වහන්සේ නමක්.

මේ කරුණුටික හොඳට දැන ගන්න. මෙතන වචන 5 කින් කෙරෙන විස්තරයක් තිබෙනවා.

- **ශාන්ත විමොක්ෂය** = අරූපාවචර ධ්‍යාන
- **අතික්කම්ම රූපෙ** = රූප අරමුණු ඉක්මවා යනවා
- **ආරුප්පා** = අරූප වෙනවා
- **තෙ කායෙන ඵුසිත්වා විහරති** = හිතින් ස්පර්ශ කරමින් වාසය කරනවා
- **විහරති පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති** = නුවණින් දැකලා ආශ්‍රවයක් ක්‍ෂය කරනවා.

මේ තමයි උභතොභාගවිමුත්ත නම් වූ රහතන්වහන්සේ.

<u>ඊළඟට ප්‍රඥා විමුක්ත පුද්ගලයා</u>

''කතමො ච, භික්ඛවෙ, පුග්ගලො පඤ්ඤාවිමුත්තො? **ඉධ, භික්ඛවෙ, එකච්චො පුග්ගලො** **යෙ තෙ සන්තා විමොක්ඛා** **අතික්කම්ම රූපෙ** **ආරුප්පා තෙ**	''මහණෙනි ප්‍රඥා විමුක්ත පුද්ගලයා කවුද? මහණෙනි, මේ සාසනයේ සමහර පුද්ගලයෝ ඒ ශාන්ත විමොක්ෂයෝ වෙත්ද රූපයන් ඉක්මවා ගියා වූ අරූප වූ ඒ ධ්‍යාන සමාපත්තීන්

<u>න කායෙන</u> ඵුසිත්වා විහරති,	නාම කයෙන්, එනම් හිතෙන් ස්පර්ශ කරලා වාසය **කරන්නේ නෑ.**

දැන් මෙතැනදී කියන්නේ නාම කයෙන් ස්පර්ශ කරන්නේ නෑ කියලා. ඒ කියන්නේ මේ ස්වාමීන්වහන්සේලාට අරූපාවචර ධ්‍යාන නෑ. ධ්‍යාන නැති බව කියලා තිබෙන විදිය තමයි මේ. (**න කායෙන ඵුසිත්වා විහරති**).

පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. **අයං වුච්චති, භික්ඛවෙ, පුග්ගලො පඤ්ඤාවිමුත්තො.** **ඉමස්සපි ඛො අහං, භික්ඛවෙ, භික්ඛුනො 'න අප්පමාදෙන කරණීය'න්ති වදාමි.** **තං කිස්ස හෙතු?** **කතං තස්ස අප්පමාදෙන.** **අභබ්බො සො පමජ්ජිතුං.**	නුවණින් මෙනෙහි කරමින් ආශ්‍රව ධර්මයන් ක්‍ෂය කරනවා. (විපස්සනා කරනවා) මේ පුද්ගලයාට කියනවා ප්‍රඥා විමුක්ත පුද්ගලයා කියලා. (මේ භික්ෂූන් වහන්සේත් රහතන්වහන්සේ නමක්). මේ රහතන් වහන්සේටත් අප්‍රමාදීව කටයුතු කරන්න කියලා මම කියන්නේ නෑ. ඒකට හේතුව කුමක්ද? උන්වහන්සේ අප්‍රමාදීව කළ යුතු සියල්ල කොට අවසන්. ඒ භික්ෂුන් වහන්සේ රහතන්වහන්සේ නමක්. ප්‍රමාද වීමට සුදුසු කෙනෙක් නොවේ.

<u>උභතොභාග පුද්ගලයන් වහන්සේලා පස්දෙනා.</u>

1. සමහර අය ආකාසානඤ්චායතන සමාපත්තියට පත්වෙලා ඒකෙන් නැඟිටලා සංස්කාර ධර්මයන් විපස්සනා කරලා කෙළෙස් නසලා රහත් භාවයට පත්වෙනවා. මේ රහතන්වහන්සේගේ ශාන්ත විමෝක්ෂය ආකාසානඤ්චායතන සමාපත්තියයි.

2. තවත් භික්ෂූන් වහන්සේ කෙනෙක් විඤ්ඤාණඤ්චායතන සමාපත්තියට සමවදිනවා. ඒ සමාපත්තියට සමවැදිලා ඒකෙන් නැගී සිට විපස්සනා කරනවා. විපස්සනා කරලා රහත් භාවයට පත්වෙනවා. මේ රහතන්වහන්සේගේ ශාන්ත විමොක්ෂය විඤ්ඤාණඤ්චායතන සමාපත්තියයි.

3. තවත් ස්වාමීන්වහන්සේ නමක් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට සමවදිනවා. ඒ රහතන්වහන්සේගේ ශාන්ත විමොක්ෂය ආකිඤ්චඤ්ඤායතන සමපත්තියයි. ඒ සමාපත්තියෙන් නැඟිටලා විදර්ශනා කරලා ඒ ස්වාමීන්වහන්සේ රහත්භාවයට පත්වෙනවා.

4. හතරවෙනි හාමුදුරුවෝ නේවසඤ්ඤා නා සඤ්ඤායතන සමාපත්තියට සමවදිනවා. සමවැදීලා ඒකෙන් ගොඩ ඇවිල්ලා නාම ධර්ම විපස්සනා කරනවා. විපස්සනා කරලා රහත් වෙනවා. ඒ තමයි ප්‍රඥාවෙන් දැකීම. ඒ රහතන්වහන්සේගේ ශාන්ත විමොක්ෂය නේවසඤ්ඤා නා සඤ්ඤායතනයයි.

5. තවත් හාමුදුරුවෝ කෙනෙක් ඉන්නවා. ඒ හාමුදුරුවන්ට අරූපාවචර සමාපත්ති කියලා සලකන්නේ නෑ. ඒ හාමුදුරුවෝ අනාගාමීන් වහන්සේ කෙනෙක්. අනාගාමීන් ස්වාමීන්වහන්සේ නමක් **'නිරෝධ සමාපත්තියට'** සමවදිනවා. ඉස්සෙල්ලා සඳහන් කල භික්ෂුන් වහන්සේලා හතර දෙනා සමවැදුනේ අරූපාවචර ධ්‍යාන සමාපත්ති වලට. මේ ස්වාමීන්වහන්සේ **නිරෝධ සමාපත්තියට** සමවැදිලා ඒකෙන් එළියට එනවා. නිරෝධ සමාපත්තියට සමවැදීලා එළියට ඇවිල්ලා පස්සේ නිරෝධ සමාපත්තියට සමවැදීමට පෙර ඒ සඳහා අධිෂ්ඨාන කරපු නාම ධර්ම මෙනෙහි කරනවා. නිරෝධ සම්පත්තිය තුල

තිබුන ස්වභාවය අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් මෙනෙහි කරන්න බෑ. හේතුව, යම් කිසි කෙනෙක් නිරෝධ සම්පත්තියට සමවැදිලා ඉන්නවා නම් රහතන්වහන්සේ නමක් හෝ වේවා අනාගාමීන් වහන්සේ නමක් හෝ වේවා ඒ වේලාවට හිත ක්‍රියාත්මක වෙන්නේ නෑ. මේ කාලය තුල චිත්ත චෛතසික නාම ධර්මයන් වැඩ කරන්නේ නැති නිසා ඒ නිරෝධ සමාපත්තියෙන් එළියට ආපු කෙනාට නිරෝධ සමපත්තිය ඇතුලත දෙයක් මෙනෙහි කරන්න බෑ. ඒක නිසා ඒ අනාගාමීන් වහන්සේට මෙනෙහි කරන්න පුළුවන් නිරෝධ සමාපත්තියට පත්වෙන්න කලින් පහළ වූ ඒ පැත්තට ගිය පාර විතරයි. (නිරෝධ සමාපත්තියට සම වැදීමට පෙර අධිෂ්ඨාන කිරීම් වශයෙන් පහළ වූ චිත්ත චෛතසික ධර්ම) මේ අනාගාමීන් වහන්සේත් නිරෝධ සමාපත්තියෙන් නැගී සිට ඊට පෙර පහළ වූ නාම ධර්ම නුවණින් මෙනෙහි කිරීම තුල උන්වහන්සේගේ හිතට අනිත්‍යය දුක්ඛ අනාත්ම වැටහිලා ආශ්‍රවයක් ක්ෂය කරලා රහත් භාවයට පත්වෙනවා. ඒ ස්වාමීන්වහන්සේටත් කියනවා **උභතොභාගවිමුත්ත** පුද්ගලයා කියලා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස මොකක්ද මේකේ රූප ධ්‍යාන වලට තිබෙන සම්බන්ධය?

<u>පිළිතුර</u> - දැන් මම මේ කියාගෙන යන්නේ උභතොභාගවිමුත්ත පුද්ගලයා ගැන. උභතොභාගවිමුත්ත පුද්ගලයෝ පස්දෙනෙක් ඉන්නවා. ඒ අය රහත්භාවයට පත්වෙන හැටි තමයි මේ කියාගෙන ආවේ. එක්කෙනක් ආකාසානඤ්චායතන ධ්‍යානයෙන් ගොඩවෙලා නාම ධර්ම විදර්ශනා කරලා විමුක්තියට පත්වෙනවා. අනිත් කෙනා විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයෙන් ගොඩවෙලා එය ස්පර්ශ කළ නාම ධර්ම විදර්ශනා කරලා විමුක්තියට පත්වෙනවා. තුන්වෙනි කෙනා ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයෙනුත් හතර වෙනි කෙනා නේවසඤ්ඤානාසඤ්ඤායත ධ්‍යානයෙනුත් ගොඩවෙලා අරූපී වූ නාම ධර්ම මෙනෙහි කරලා විමුක්තියට පත්වෙනවා. මේ ස්වාමීන්වහන්සේලාගේ විශේෂත්වය තමයි ඒ ස්වාමීන්වහන්සේලා ධ්‍යාන සමාපත්ති වලට සමවැදුනට පස්සේ රූපධර්ම මෙනෙහි කරන්නේ නෑ. රූප ධර්ම මෙනෙහි කරන්නේ නැත්තේ රූප සංඥාව නැති නිසා. ඒක නිසා මෙනෙහි කරන්නේ නාම ධර්ම විතරයි. නාම ධර්ම මනසිකාරය කරලා තමයි මේ ස්වාමීන්වහන්සේලා මිදෙන්නේ. මේ ධ්‍යාන වලට පත්වෙන්නේම රූපය ඉක්මවලා. ඊළඟට පස්වෙනි උභතොභාගවිමුත්ත පුද්ගලයාගේ විශේෂත්වය තමයි අනාගාමීන් වහන්සේ නමක් නිරෝධ සමාපත්තියට සමවැදිලා ඒකෙන් නැගී සිට නිරෝධ සමාපත්තියට සමවැදීමට පහළ වූ චිත්ත අධිෂ්ඨාන ආදී ඒ නාම ධර්ම මෙනෙහි කරලා , විදර්ශනා කරලා රහත් වෙනවා.

අපි restaurants කියලා කිව්වහම කොරියන් කෑම, තායි කෑම, ඉන්දියන් කෑම, සිංහල කෑම, ජපන් කෑම වගේ නොයෙකුත් කෑම වර්ග තිබෙන විවිධ restaurants තිබෙනවා. ඒ වගේ අපි 'සමාපත්ති' 'සමාපත්ති' කියලා කිව්වට ඔය සමාපත්ති වලට පත්වෙන, සමාපත්ති හැදෙන ක්‍රම කීපයක්ම තිබෙනවා. කුසල පක්ෂයෙන් ගත්තහම තිබෙනවා රූපාවචර ධ්‍යාන සමාපත්ති. එනම් රූපාවචර ප්‍රථම ධ්‍යානය සමාපත්තිය, රූපාවචර ද්විතිය ධ්‍යාන සමාපත්තිය, රූපාවචර තෘතිය ධ්‍යාන සමාපත්තිය, රූපාවචර චතුර්ථ ධ්‍යාන සමාපත්තිය. මෙතනම තිබෙනවා සමාපත්ති හතරක්. මේවා රූපාවචරයි. ඒ කියන්නේ මොකක් හරි රූප අරමුණක් තිබෙන්නේ.

ඊළඟට මේ ධ්‍යාන වල තිබෙන ස්වභාවය ඉක්මවා ගියා වූ රූප පිළිබඳව කිසිම සම්බන්ධයක් අදහසක් නැත්තා වූ අරූපී ධර්ම අරමුණු කරන්නාවූ ධ්‍යාන තිබෙනවා. ඒ තමයි ආකාසානඤ්චායතන සමාපත්තිය, විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය, ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය. මේවාට කියනවා අරූපාවචර ධ්‍යාන සමාපත්ති කියලා. මේ සමාපත්ති අටම එකම ජාතියක් නොවෙයි. මේවාට අෂ්ඨ සමාපත්ති කියලා පොදුවේ කථා කරන්න පුළුවන්. ඔක්කොම restaurants තමයි. නමුත් මේවගේ තිබෙන්නා වූ වෙනස් කම් තිබෙනවා. හතරක් රූපාරම්මණිකයි. හතරක් අරූපා රම්මණිකයි. ඒක නිසා තමයි රූපාවචර සහ අරූපාවචරයි කියලා කියන්නේ. ඔය අටට අමතරව රූපයකුත් අරමුණු කරන්නේ නැති නාමයකුත් අරමුණු කරන්නේ නැති සමාපත්තියක් තිබෙනවා. නමුත් රූපාවචර අරමුණක් නැති අරූපාවචර අරමුණක් නැති ලෞකික හිතක් තිබෙන කෙනෙකුට ඒ කියනලද නිරෝධ සමාපත්තියට සම වැදෙන්න බෑ. අනාගාමීන් වහන්සේ කෙනෙකුට හෝ රහතන්වහන්සේ

කෙනෙකුට හැර වෙන කිසිකෙනෙකුට **නිරෝධ සමාපත්තිය**ට පත්වෙන්න බෑ. සෝවාන් කෙනෙකුටත් බෑ. එතැන නාම රූප මුකුත් නැති නිවිච්ච තැනක්. එතන තිබෙන්නේ නිවන. හිත නිවී ගිහිල්ලා නැවතිලා තිබෙනවා.

දැන් මෙහෙම හිතන්න. අපි lighter එකක් පත්තුකරනවා. එතකොට දැල්ලක් ඇතිවෙනවා. අපි ටික වෙලාවකින් ඒක නිවලා දානවා. දැන් තිබෙනවාද දැල්ලක්? නෑ. විනාඩි 5 ක් විතර එහෙම තිබිලා නැවත lighter එක පත්තු කරනවා. එතකොට නැවත පත්තුවෙනවා. එතකොට විනාඩි 5 ක් ඒ දැල්ල නැතුව තිබුනා. එතන දුමක් තිබුනෙත් නෑ, පාටක් තිබුනෙත් නෑ. රස්නෙකුත් නෑ. නිරෝධ සමාපත්තියට සමවැදුන ආර්යන්වහන්සේගේ හිතේ වැඩ කිරීමක් අරමුණු ගැනීමක් චේතනාවක් ස්පර්ශ ගතියක් වේදනාවක් මොකක්වත්ම නෑ. හිත සම්පූර්ණයෙන්ම නවතිනවා. අනාගාමීන්වහන්සේ හෝ රහතන්වහන්සේ කය නොවැටෙන විදියට කෙලින් හිඳුවා එක අවස්ථාවක සිත නවත්වනවා. එතකොට හිතත් නෑ චෛතසික ටිකත් නෑ, චිත්ත ක්‍රියා කාරී ස්වභාව මොකුත් නෑ. ඒ නිවීම් ස්වභාවයට **නිරෝධ සම්පත්තිය** කියලා නම් කරනවා. ඒ ස්වභාවයට සමවැදීමට පෙර උන්වහන්සේලා අධිෂ්ඨාන කරනවා ඒ සමාපත්තිය කොපමණ වෙලාවක් පැවතිය යුතුද කියලා. පැයක්ද පැය භාගයක්ද යනුවෙන් යම් කිසි කාලයක් අධිෂ්ඨාන කරනවා. නමුත් ඒ කාලය තුල උන්වහන්සේලා කිසිම දෙයක් විඳින්නේ නෑ. උදා: පැය භාගයක් උන්වහන්සේලා නිරෝධ සමාපත්තියට සමවැදුනා කියලා කියන්නේ ඒ ඇතුලත විඳපු දෙයක් නෑ. ඒ කාලයෙන් පස්සේ නැවතත් සිත වැඩ කරන්න පටන් ගන්නවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එහෙම සිත නවත්වන්න හේතුවක් තිබෙනවද?

<u>පිළිතුර</u> - ඔව් හේතුවක් තිබෙනවා, ශාන්තයි. මේ අවස්ථාවේදී නිවන් සැප විඳිනවා කියලා අපි කිව්වට නිවන් සැප විඳීමකුත් ඒකෙ නෑ. එතැන නිවීමක් තිබෙනවා. ඒකට කියනවා නිරෝධ සමාපත්තිය කියලා.

නමුත් රූපාවචර සමාපත්ති වල විඳීමක් තිබෙනවා. ඒකට හේතුව, ඒ සමාපත්ති තුල හිත වැඩකරනවා. හිතට අරමුණු වෙන්නා වූ දෙයක් තිබෙනවා. නිරෝධ සමාපත්තියට සමවදින්න නම් අෂ්ඨසමාපත්ති තිබෙන්න ඕන. ප්‍රථම ධ්‍යානය, ද්විතිය ධ්‍යානය, තෘතිය ධ්‍යානය, චතුත්ථ ධ්‍යානය, ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතනය කියන ධ්‍යාන අටම තිබෙන්න ඕන. එහෙම හිත සියුම් කරගෙන සියුම් කරගෙන ගිහිල්ලා තමයි නිරෝධ සමාපත්තියට සමවැදෙන්නේ. මේවාට කියනවා **'නව අනුපුබ්බවිහාර සමාපත්ති'** කියලා සඳහන් කරනවා. මේ සමාපත්ති අට තිබෙන අනාගාමීන් වහන්සේලාට නිරෝධ සමාපත්තියට වදින්න පුළුවන්. මේ ධ්‍යාන අට තිබෙන රහතන්වහන්සේලාටත් නිරෝධ සමාපත්තියට සමවදින්න පුළුවන්. 'සංඥාවේදයිත නිරෝධය' කියන්නෙත් නිරෝධ සම්පත්තියටමයි.

දැන් අපි සූත්‍රයට අනුව උභතොභාගවිමුත්ත පුද්ගලයන් 5 දෙනෙක් ගැන කථා කළා.

ඊළඟට **පඤ්ඤාවිමුක්ත** පුග්ගලයන් වහන්සේ. පළවෙනි පඤ්ඤාවිමුත්ත පුද්ගලයාට ධ්‍යාන නෑ. පඤ්ඤාවිමුත්ත පුද්ගලයෝ කියන්නේ නුවණින් සංස්කාර ධර්ම ස්වභාවයන් දැකලා මෙනෙහි කරලා රහත්භාවයට පත් වූ උත්තමයෝ. මෙතැනදී විශේෂයෙන් කියන්නේ නෑ රූප මෙනෙහි කිරීමද නාම මෙනෙහි කිරීමද කියලා. මේ අවස්ථාවේදී උන්වහන්සේලා නාම රූප දෙකම මෙනෙහි කරනවා. අපි හැම වේලේම කියනවා සිහියෙන් ඉන්න, සිහියෙන් කථා කරන්න කියලා. හැම වේලේම සතිපට්ඨානය වඩන්න කියලා කියනවා. මේ ක්‍රමය තුල ධ්‍යාන වැඩීමක් නෑ. මේකට කියනවා 'ශුෂ්ක' ක්‍රමය කියල. ඒ කියන්නේ ධ්‍යාන සමාපත්ති නැතුව උනත් මොනවා කළත් සතියෙන්ම කරනවා. තුවාලයක් වෙලා වේදනාවක් විඳින අවස්ථාවකදී වුවත් ඒකත් සතියෙන්මයි විඳින්නේ. යමක් දැක්කද ඒ දැකීම හොඳට හිතලා බලනවා. මෙනෙහි කරනවා. ඒ පුද්ගලයන් වහන්සේලාගේ නුවණ හොඳට bright වෙලා තිබෙනවා. ඕන දෙයක් මෙනෙහි කරන්න, හඳුනා ගන්න පුළුවන්. නමුත් ධ්‍යාන නෑ. මෙලෙස නුවණින් මෙනෙහි කරලා විපස්සනා කරලා නුවණින් සංස්කාර ධර්මයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් දැකලා

කෙලෙස් නසලා රහත් භාවයට පත්වෙන පුද්ගලයන් වහන්සේලා පඤ්ඤාවිමුක්ත පුග්ගලයන් වහන්සේලා යනුවෙන් හඳුන්වනවා.

<u>පඤ්ඤාවිමුක්ත පුග්ගලයන් වහන්සේලා 5 දෙනා.</u>

1. ධ්‍යාන නැතුව සම්පූර්ණයෙන්ම ශුෂ්ක ක්‍රමයට විපස්සනා කරලා රහත් භාවයට පත්වෙන පුද්ගලයා. මේ පුද්ගලයාට විදර්ශක පුද්ගලයා කියලා කියනවා. මේ එක පඤ්ඤාවිමුක්ත පුද්ගලයෙක්.

2. සමහර ස්වාමීන්වහන්සේලා භාවනා කරලා භාවනා කරලා අඩුතරමේ ප්‍රථම ධ්‍යානයවත් ලබාගන්නවා. ඔහු මේ ප්‍රථම ධ්‍යානයට (රූපාවචර) සමවැදිලා ප්‍රථම ධ්‍යානයෙන් නැගී සිට එහි තිබූ 'නාම ධර්ම රූප ධර්ම' මෙනෙහි කරලා අනිත්‍ය දුක්ඛ අනාත්ම වඩාගෙන කෙලෙස් නසා රහත් භාවයට පත්වෙනවා. ඒකට කියනවා පඤ්ඤාවිමුක්ත පුද්ගල භාවයට පත් උනා කියලා.

3. තව ස්වාමීන්වහන්සේ කෙනෙක් දෙවෙනි රූපාවචර සමාපත්තියට සමවැදිලා ඊට පස්සේ ඒකෙන් නැගී සිට නාම ධර්ම සම්මර්ශනය කරලා රූප ධර්ම සම්මර්ශනය කරලා රහත් භාවයට පත්වෙනවා, ඔහුටත් කියනවා පඤ්ඤාවිමුක්ත පුද්ගලයා කියලා.

4. තව ස්වාමීන්වහන්සේ කෙනෙක් තුන්වෙනි රූපාවචර සමාපත්තියට සමවැදිලා ඊට පස්සේ ඒකෙන් නැගී සිට නාම ධර්ම සහ රූප ධර්ම සම්මර්ශනය කරලා රහත් භාවයට පත්වෙනවා, ඔහුටත් කියනවා පඤ්ඤාවිමුක්ත පුද්ගලයා කියලා.

5. තව ස්වාමීන්වහන්සේ කෙනෙක් හතරවෙනි රූපාවචර සමාපත්තියට සමවැදිලා ඊට පස්සේ ඒකෙන් නැගී සිට නාම ධර්ම සම්මර්ශනය කරලා රූප ධර්ම සම්මර්ශනය කරලා රහත් භාවයට පත්වෙනවා, ඔහුටත් කියනවා පඤ්ඤාවිමුක්ත පුද්ගලයා කියලා.

මේ උභතොභාගවිමුත්ත රහතන්වහසේලාත් පඤ්ඤාවිමුක්ත රහතන්වහන්සේලාත් රහත් භාවයෙන් සමානයි. එහෙම නම් ඇයි අපි මෙහෙම 'උභතොභාගවිමුත්ත' 'පඤ්ඤාවිමුක්ත' වශයෙන් නම් කරලා තිබෙන්නේ? උන්වහසේලා රහත් භාවයට පත්වෙන්න කෙලෙස් නසපු මාර්ගය වල තිබෙන විවිධත්වය වශයෙන් තමයි මේ වගේ වෙනස් ආකාරයට නම් කරලා තිබෙන්නේ. මේ ස්වාමීන්වහන්සේලා ඔවුන්ට තිබෙන හැකියාවන් වශයෙන් වෙනස්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස මේ ස්වාමීන්වහන්සේලාට නිරෝධ සමාපත්තීන්ට සම වැදීමට හැර වෙනත් හැකියාවල් වල වෙනසක් තිබෙනවද?

<u>පිළිතුර</u> - නිරෝධ සමාපත්තියට සමවැදීම වගේම උන්වහසේලාගේ පූර්ව කුසල ධර්ම හේතුවෙන්, ප්‍රාර්ථනා හේතුවෙන් ලබා ගත්තු ශක්තියෙන් කළහැකි වෙන වෙන හැකියාවල් තිබෙනවා. රහත් භාවයේ වෙනසක් නෑ. උන්වහසේලාගේ තිබෙන්නා වූ පුණ්‍ය වාසනාව නිසා සමහර ස්වාමීන්වහන්සේලාට දිවැස් ශක්තිය වැඩියි. පූර්වේනිවාසානුස්සතිය, ඉර්දි පාන්න පුළුවන් ගතිය, අහසින් යන්න පුළුවන් ගතිය හැම රහතන්වහන්සේටම නෑ. සමහර ස්වාමීන්වහන්සේලා පඤ්ඤා විමුක්තයි, ඒ උනාට ඒ ස්වාමීන්වහන්සේලා වැඩිය ඉර්දි ප්‍රාතිහාර්ය පාන්නේ නෑ. ඒ ස්වාමීන්වහන්සේලා සමාපත්ති සුවයෙන් වැඩ ඉන්නවා. නමුත් ඒ ස්වාමීන්වහන්සේලාට අනිත් ස්වාමීන්වහන්සේලාට මෙන් කෙසේ හෝ ඉර්දි ලබා ගැනීමට අවශ්‍යයයි කියලා විශේෂ ආසාවල් ඇතිවෙන්නේ නෑ. නමුත් සමහර ශුෂ්ක විදර්ශක රහතන්වහන්සේලා පසුව ඉතා ඉකමණින් චිත්ත සමාධි ගුණ ලබාගත්තු අවස්ථාත් තිබෙනවා. එයට ඒ

ස්වාමීන්වහන්සේලාගේ පෙර සංසාරයේ කුසලයත් බල පානවා. උන්වහන්සේලා ලෝක උපකාරය සඳහාත් එහෙම කරනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එතකොට නිරෝධ සමාපත්තියට සමවදින්න බැරි රහතන්වහන්සේලා සමවදින්නේ ඵල සමාපත්ති වලටද?

<u>පිළිතුර</u> - ඔව් ඵල සමාපත්තිවලට. ඒක මම වෙන වෙලාවක කියලා දෙන්නම්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දැන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවදින භික්ෂූන්වහන්සේට පුළුවන් ඒකෙන් නැගී සිටලා ඒ නාම ධර්ම අරමුණු කරලා රහත් වෙන්න. එතකොට ඒ රහතන් වහන්සේට පුළුවන් නිරෝධ සමාපත්තියටත් සමවදින්න. එතකොට ඊට පහළින් ඇති ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට සමවැදිලා ඒකෙන් නැගිටලා නාම ධර්ම විදර්ශනා කරලා රහත්වෙන ස්වාමීන්වහන්සේට නිරෝධ සමාපත්තියට සම වදින්න බෑ, එහෙම නේද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - ඔව්, අෂ්ඨසමාපත්තිම නැති නිසා බෑ. ඒ අඩුපාඩුව හදාගන්න ඕන. ඒක ඉතා ඉක්මණින් හදාගන්න පුළුවන්.

බුදුරජාණන් වහන්සේ මේ පඤ්ඤාවිමුත්ත පුද්ගලයන් වහන්සේටත් අප්‍රමාදීව කටයුතු කරන්න කියන්නේ නෑ.

<u>ඊළඟට කායසක්ඛි පුද්ගලයා.</u>

‘‘කතමො ච, භික්ඛවෙ, පුග්ගලො කායසක්ඛි? **ඉධ, භික්ඛවෙ, එකච්චො පුග්ගලො යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ කායෙන ඵුසිත්වා විහරති, පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති.** **අයං වුච්චති, භික්ඛවෙ, පුග්ගලො කායසක්ඛි.**	මහණෙනි, කායසක්ඛි නම් වූ පුද්ගලයා කවුද? මහණෙනි මේ සාසනයේ සමහර පුද්ගලයෝ ශාන්ත විමොක්ෂය කියන අරූපාවචර ධ්‍යානවලින් නැගී සිට ඒ නාම ධර්ම විදර්ශනා කරනවා. මේ අවස්ථාවේදී උන්වහසේලාගේ සමහර කෙලෙස් නැති වෙනවා, (**එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති** = සමහර ආශ්‍රවයෝ පමණක් නැතිවෙනවා) මේ තමයි මහණෙනි කායසක්ඛි පුද්ගලයා.

එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති කියලා කිව්වහම යම්කිසි කෙලෙස් ප්‍රමාණයක් නැතිවීමෙන් සෝවාන් වෙන්න පුළුවන්. එතකොට නැතිවෙන්නේ ‘සක්කායදිට්ඨි’ ‘විචිකිච්චා’ ‘සීලබ්බතපරාමාස’ යන කෙලෙස් ධර්ම. සකෘදාගාමී වෙනකොටත් ටිකක් කෙළෙස් නැති වෙනවා. අනාගාමී වෙනකොටත් කෙළෙස් ටිකක් නැතිවෙනවා. නමුත් තවත් ඉතිරි වූ කෙලෙස් තිබෙනවා.

ඉමස්ස ඛො අහං, භික්ඛවෙ, භික්ඛුනො ‘අප්පමාදෙන කරණීය’න්ති වදාමි. **තං කිස්ස හෙතු?** **අප්පෙව නාම අයමායස්මා අනුලොමිකානි සෙනාසනානි පටිසෙවමානො කල්‍යාණමිත්තෙ භජමානො ඉන්ද්‍රියානි සමන්නානයමානො**	මහණෙනි මම මේ භික්ෂූන් වහන්සේට අප්‍රමාදීව කටයුතු කරන්න කියලා කියනවා. කුමක්ද හේතුව? මේ ආයුෂ්මතුන් වහන්සේ සුදුසු ගැලපෙන සේනාසන පරිහරණය කරමින් යහපත් හොඳ හිත්

යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං – බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙයාාති!	ඇති සත්පුරුෂයන් අසුරුකරමින් ඉන්ද්‍රිය ධර්මයන් සම කරමින් යම් කිසි කුලපුත්‍රයෙක් උතුම් නිවන අරමුණු කොට මේ සාසනයේ පැවිදි උනාද ඒ භික්ෂුවට මේ ජීවිත කාලයේදීම එම නිවන සාක්ෂාත් කර ගැනීමට හැකිවෙනවා නම් හොඳයි කියන අදහසින් අවවාද අනුශාසන කරනවා.
ඉමං ඛො අහං, භික්ඛවෙ, ඉමස්ස භික්ඛුනො අප්පමාදඵලං සම්පස්සමානො ‘අප්පමාදෙන කරණීය’න්ත්න්ත්ති වදාමි.	මහණෙනි, මම මෙන්න මේ භික්ෂුවට අප්‍රමාදී ඵලය අපේක්ෂා කරමින් අප්‍රමාදීව කටයුතු කරන්න කියලා කියනවා.

කායසක්ඛි පුද්ගලයාට බුදුරජාණන්වහන්සේ ධර්ම දේශනා කරනවා. ඔහුට තව කෙලෙස් තිබෙන නිසා.

<u>කායසක්ඛි පුද්ගලයෝ 6 දෙනා වහන්සේ .</u>

1. සෝවාන් ඵලයට පත් වූ පුද්ගලයා.
2. සකෘදාගාමී මාර්ගය වඩන පුද්ගලයා.
3. සකෘදාගාමී ඵලයට පත් වූ පුද්ගලයා.
4. අනාගාමී වෙන්න මාර්ගය වඩන පුද්ගලයා.
5. අනාගාමී ඵලයට පත් වූ පුද්ගලයා.
6. රහත් වීමට මාර්ගය වඩන්නා වූ කෙනා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස සෝවාන් මාර්ගයේ ඉන්න කෙනා නැත්ද?

<u>පිළිතුර</u> - නෑ, හේතුව එයා කෙලෙස් නසලා නෑ. **කායසක්ඛි** පුද්ගලයෙන් වීමට නම් ටිකක් හරි කෙලෙස් නසලා තිබෙන්න ඕන. අරූපාවචර ශාන්ත විමොක්ෂයනුත් තිබෙන්න ඕනෑ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එතකොට ඒ හය දෙනාම අරූප ධ්‍යාන වඩලා ඉවරයි?

<u>පිළිතුර</u> - හොඳට බලන්න පාලි පාඨය.

‘‘කතමො ච, භික්ඛවෙ, පුග්ගලො කායසක්ඛි?	මහණෙනි, කායසක්ඛි නම් වූ පුද්ගලයා කවුද?
ඉධ, භික්ඛවෙ, එකච්චො පුග්ගලො යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ කායෙන ඵුසිත්වා විහරති, පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති.	මහණෙනි මේ සාසනයේ සමහර පුද්ගලයෝ යම්කිසි ශාන්ත විමොක්ෂයක් වෙයිද රූපයන් ඉක්මවා ආරූපී වූ ඒ ධර්ම නාම කයෙන් සපර්ශ කොටගෙන වාසය කරනවා කරනවා. මේ අවස්ථාවේදී උන්වහසේලාගේ සමහර කෙලෙස් නැති වෙනවා, **(එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති = සමහර ආශ්‍රවයෝ පමණක් නැතිවෙනවා)**
අයං වුච්චති, භික්ඛවෙ, පුග්ගලො කායසක්ඛි.	මේ තමයි මහණෙනි කායසක්ඛි පුද්ගලයා.

ඊළඟට දිට්ඨිප්පත්ත පුද්ගලයා

‘‘කතමො ච, භික්ඛවෙ, පුග්ගලො දිට්ඨිප්පත්තො?	මහණෙනි, දිට්ඨිප්පත්ත පුද්ගලයා නම් කවුද?
ඉධ, භික්ඛවෙ, එකච්චො පුග්ගලො	මහණෙනි මේ සාසනයේ සමහර පුද්ගලයන් වහන්සේලා
යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ න කායෙන ඵුසිත්වා විහරති	යම් කිසි අරූපී වූ ශාන්ත විමෝක්ෂයක් වේද ඒවා නුවණින් ස්පර්ශකොට ගෙන වාසය නොකරයි.
පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති, තථාගතප්පවෙදිතා චස්ස ධම්මා පඤ්ඤාය වොදිට්ඨා හොන්ති වොචරිතා.	ප්‍රඥාවෙන් දැක උන්වහන්සේලාගේ සමහර කෙලෙස් නැති වෙනවා.
තථාගතප්පවෙදිතා චස්ස ධම්මා පඤ්ඤාය වොදිට්ඨා හොන්ති වොචරිතා. අයං වුච්චති, භික්ඛවෙ, පුග්ගලො දිට්ඨිප්පත්තො	ඔහුට තථාගතයන් වහන්සේ දේශනා කළා වූ මේ සාසනයේ ධර්ම මනසින් දැකීමේ හැකියාව තිබෙනවා.
අප්පෙව නාම අයමායස්මා අනුලොමිකානි සෙනාසනානි පටිසෙවමානො කල්‍යාණමිත්තෙ භජමානො ඉන්ද්‍රියානි සමන්නානයමානො – යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං – බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යාති!	මේ ආයුෂ්මතුන් වහන්සේ සුදුසු ගැලපෙන සේනාසන පරිහරණය කරමින් යහපත් හොඳ හිත් ඇති සත්පුරුෂයන් ඇසුරුකරමින් ඉන්ද්‍රිය ධර්මයන් සම කරමින් යම් කිසි කුලපුත්‍රයෙක් උතුම් නිවන අරමුණු කොට මේ සාසනයේ පැවිදි උනාද ඒ භික්ෂුවට මේ ජීවිත කාලයේදීම එම නිවන සාක්ෂාත් කර ගැනීමට හැකිවෙනවා නම් හොඳයි කියන අදහසින් අවවාද අනුශාසන කරනවා.
ඉමං ඛො අහං, භික්ඛවෙ, ඉමස්ස භික්ඛුනො අප්පමාදඵලං සම්පස්සමානො ‘අප්පමාදෙන කරණීය’න්ති වදාමි.	මම මේ භික්ෂූන් වහන්සේටත් කියනවා අප්‍රමාදීව කටයුතු කරන්න කියලා.

දිට්ඨිප්පත්ත කියන ආර්යන්වහන්සේලා 6 දෙනෙක් වෙනවා. දිට්ඨිප්පත්ත ආර්යන්වහන්සේලාගේ තිබෙන වෙනස තමයි ශාන්ත විමොක්ෂ නම් වූ අරූපී ධ්‍යාන සමාපත්ති ඇසුරු කරන්නේ නෑ. නමුත් දිට්ඨිප්පත්ත ආර්යන්වහන්සේලාට බුදුරජාණන් වහන්සේ දේශනා කළාවූ නාම රූප ධර්ම පිළිබඳව හොඳට නුවණින් සලකන්න පුළුවන්.

දිට්ඨිප්පත්ත පුද්ගලයන් වහන්සේලා හයදෙනා

1. සෝවාන් ඵලයට පත් වූ කෙනා.
2. සකෘදාගාමී මාර්ගයට පත් වූ කෙනා.
3. සකෘදාගාමී ඵලයට පත් වූ කෙනා.
4. අනාගාමී මාර්ගයට පත් වූ කෙනා.
5. අනාගාමී ඵලයට පත් වූ කෙනා.
6. අරිහත් මාර්ගය පිළිපදින්නා වූ කෙනා.

දිට්ඨිප්පත්ත පුද්ගලයන් වහන්සේලාගේ භාවනා ක්‍රමය මේ විදියට හඳුන්වනවා. **දුක්ඛා සඞ්ඛාරා, සුඛො නිරොධොති** කියලා. ඒ කියන්නේ සංස්කාර ධර්මයන් අසුරුකිරීම හරිම කරදරයි, දුක් සහගතයි, පීඩා කාරියි

කියලා හැඟීමක් ඇතිවෙනවා. 'මේ නාම රූප ධර්මයන්ගෙන් අයින් වෙලාම යන්න ඇත්නම් හොඳයි' කියලා හිතලා නාම රූප ධර්ම විදර්ශනා කරලා මාර්ග ඵල වලට පත්වෙන පුද්ගලයා තමයි දිට්ඨිප්පත්ත පුද්ගලයන් වහන්සේ කියලා කියන්නේ. මේ දිට්ඨිප්පත්ත පුද්ගලයන් වහන්සේලාටත් ධර්ම දේශනාව අවශ්‍යයි.

<u>ඊළඟට සද්ධාවිමුත්ත පුද්ගලයන් වහන්සේ.</u>

''කතමො ච, භික්ඛවෙ, පුග්ගලො සද්ධාවිමුත්තො.	මහණෙනි ශ්‍රද්ධා විමුක්ත පුද්ගලයා නම් කවුද?
ඉධ, භික්ඛවෙ, එකච්චො පුග්ගලො	මහණෙනි මේ සාසනයේ සමහර පුද්ගලයන් වහන්සේලා
යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ න කායෙන ඵුසිත්වා විහරති, පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති,	යම් කිසි ශාන්ත විමොක්ෂයක් වන රූපාවචර ධ්‍යානයක් චේද උන්වහසේලා ඒවා නාම කයෙන් ස්පර්ශ කරමින් වාසය <u>කරන්නේ නෑ</u>. නමුත් නුවණින් දැකලා සමහර කෙලෙස් නැතිවෙලා විනාස වෙලා තිබෙනවා.
තථාගතෙ චස්ස සද්ධා නිවිට්ඨා හොති මූලජාතා පතිට්ඨිතා.	තථාගතයන් වහන්සේ කෙරෙහි ගෞරවය හොඳටම පිහිටලා තිබෙනවා.
ඉමං ඛො අහං, භික්ඛවෙ, ඉමස්ස භික්ඛුනො අප්පමාදඵලං සම්පස්සමානො 'අප්පමාදෙන කරණීය'න්ත්න්ත්ති වදාමි.	මේ තමයි සද්ධා විමුක්ති පුද්ගලයා. මේ පුද්ගලයන් වහන්සේටත් මම අප්‍රමාදීව කටයුතු කරන්න කියලා කියනවා.

'උභතොභාගවිමුත්ත' 'පඤ්ඤාවිමුත්ත' 'කායසක්ඛි' 'දිට්ඨිප්පත්ත' 'සද්ධාවිමුත්ත' යන පුද්ගලයන් වහන්සේලා මේ විදියට බෙදෙන්නේ කුමක් මුල් කරගෙනද? උන්වහන්සේලා අනුගමනය කරන්නා වූ පිළිවෙත් මාර්ග අනුවයි. නමුත් සෝවාන් සකෘදාගාමී අනාගාමී අරහත් යන මාර්ග ඵල වශයෙන් සමානයි. එතැනට යන මාර්ග තමයි වෙනස් වෙන්නේ.

සමහර අය සෝවාන් ඵලයට පත්වෙනවා ශ්‍රද්ධාව මුල් කරගෙන. සමහර අය සෝවාන් ඵලයට පත්වෙනවා ප්‍රඥාව මුල් කරගෙන. ශ්‍රද්ධාව මුල් කරගෙන බුදුරජාණන්වහන්සේ කෙරෙහි ධර්මය කෙරෙහි නිවන කෙරෙහි හරි ශ්‍රද්ධාවක් පැහැදීමක් ඇතුව යන කෙනාට කියනවා **සද්ධාවිමුත්ත පුද්ගලයා** කියලා. ප්‍රඥාව මුල් කරගෙන යන කෙනාට කියනවා **දිට්ඨිප්පත්ත පුද්ගලයා** කියලා. අපි හැම කෙනාගේම ධර්මවල තිබෙනවා උස් පහත් බවක්. සමහර අයගේ ශ්‍රද්ධාව වැඩියි. ප්‍රඥාව අඩුයි. ශ්‍රද්ධාව වැඩි ප්‍රඥාව අඩු කෙනා මාර්ගය වඩනකොට එයාට හැමවෙලේම උදව් වෙන්නේ ශ්‍රද්ධාව. නමුත් මුලාවෙන තැනුත් තිබෙනවා. හරියටම track එකට වැටෙන තැන් වලදී හැර අනිත් තැන් වලදී මුලා වෙනවා. ශ්‍රද්ධාව නිසා එයා හැම තැනම පහදිනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ධ්‍යාන ඵල වලට නොගොහින් අපිට ශ්‍රද්ධාවෙන් ...? (පැහැදිලි මදි)

<u>පිළිතුර</u> - මෙතැන සද්ධාවිමුත්ත පුද්ගලයා කියලා කියන්නේ සද්ධාව මුල් කරගෙන සද්ධාවේ උපකාරය ලබා සද්ධාව ප්‍රධාන අංගයක් කරගෙන ඒ පිහිටෙන් විමුක්තියට පත් වූ කෙනාට. එයාගේ ස්වභාවය තමයි **එතෙසු හි සද්ධාවිමුත්තස්ස පුබ්බභාගමග්ගක්ඛණෙ සද්දහන්තස්ස විය ඔකප්පෙන්තස්ස විය අධිමුච්චන්තස්ස විය ච කිලෙසක්ඛයො හොති.** ඒ කියන්නේ කෙලෙස් නසන වේලාවේ තමයි එයාට සද්ධාව නිවනට හැරිලා වැඩ කරන්නේ. ඒ මාර්ග අවස්ථාවේදී. නමුත් ඊට කලින් අවසථාවලදී ඔය සද්ධාව වැඩියෙන් තිබෙන අය සායි බාබා ගාවටත් ගිහිල්ලා එතැනදිත් අත්පුඩියක් දෙකක් ගහලා ඊළඟට කෝවිලකටත් ගිහිල්ලා එතැනත් පූජාවක් මොකක් හරි දෙයක් කරලා පන්සලටත් ඇවිල්ලා

අපිටත් වැඳලා ලොකු හාමුදුරුවන්ටත් වැඳලා අනිත් හාමුදුරුවන්ටත් වැඳලා තිබෙන දෙයක් පූජාකරනවා. ඔන්න ඔය වාගේ වැඩ කරනවා ශ්‍රද්ධාව වැඩි කෙනා. හැම එකකටම සාධු කාර දෙනවා, ප්‍රඥාව අඩු නිසා.

ශ්‍රද්ධාව අඩු කෙනා හැම වේලේම ශ්‍රද්ධාව ඇසුරු කරන ඒවාට ගරහනවා. ශ්‍රද්ධාවෙන් කරන්න තිබෙන්න පුද පූජාවක් තිබෙනවා නම් මලක් පහනක් පූජා කරලා වඳිනවා නම් ඒකට එයා අකමැතියි. ඒ අය කියනවා 'ඒවා බුදුහාමුදුරුවෝ කියපු ඒවා නොවෙයි, පසු කාලීනව හදාගත්තු ඒවා' කියලා. 'මම තමයි ප්‍රඥා වන්ත එන්න මම ගාවට කියලා' කියනවා. එයා හැම එකකටම නුවණ දාන්න යනවා. විද්‍යාවෙනුත් ටිකක් ගන්නවා, biology ටිකකුත් ඒකට දා ගන්නවා, computer සම්බන්ධ දේවලුත් දාගන්නවා, ඔය අස්සේ නාසා ආයතනය පැත්තේ දේවලුත් දාල කාල් ගානවා. එයාට ශ්‍රද්ධාව නෑ, එයා ප්‍රඥාවේ ස්වභාවය ගන්නවා. එතනට දෘෂ්ඨිය එනවා, දෘෂ්ඨිය ඇසුරු කරනවා. එහෙම උනහම අපිට බුදුරජාණන්වහන්සේ ගැන ශ්‍රද්ධාව පිහිටන්නේ නෑ. අපිට විස්වාසය පිහිටන්නේ එංගලන්තේ හරි කොහේ හරි රටක් ගණිත විද්‍යාව කරලා එන්ජිනේරු වැඩක් හරි වෙන මොනවා හරි දේවල් කරලා පොතුත් ලියලා divorce වෙලා මහා වින්නැහියක් වෙලා ඊට පස්සේ කොහේ හරි අසරණව මිය පරලොව ගිය එක්කෙනා ගැන අපිට පැහැදීමක් ඇතිවෙනවා. එයා තමයි ඊට පස්සේ සරණ යන්නේ. ඔය විද්‍යාව වගේ දේවල් දාගත්තු ගමන්ම එතැන ශ්‍රද්ධාව නෑ. ඒක නිසා අපි ශ්‍රද්ධාවයි ප්‍රඥාවයි balance කරන්න ඕන.

බුදුරජාණන්වහන්සේ **ශ්‍රද්ධා විමුක්තයි** කියලා කියන්නේ ශ්‍රද්ධාවෙන් නොයෙකුත් දේවල් කරමින් ගිහිල්ලා අවසානයේදී සද්ධාව මුල් කරගෙන විමුක්තියට පත් වෙන කෙනාට. එතකොට බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා **මූලජාතා පතිට්ඨිතා** කියලා. ඒ කියන්නේ ශ්‍රද්ධාවෙන් තථාගතයන් වහන්සේ කෙරෙහි පිහිටියා කියලා. හැබැයි එතැනින් එහාට මොන පූසාරි කෙනෙකුටවත් එයා රැවටෙන්නේ නෑ. කිසිම දේවාලයකට එයා යන්නේ නෑ.

<u>සද්ධාවිමුත්ත පුද්ගලයන් වහන්සේලාත් හය දෙනෙක් වැඩ සිටිනවා.</u>

1. සෝවාන් ඵලයට පත් වූ කෙනා.
2. සකෘදාගාමී මාර්ගයට පත් වූ කෙනා.
3. සකෘදාගාමී ඵලයට පත් වූ කෙනා.
4. අනාගාමී මාර්ගයට පත් වූ කෙනා.
5. අනාගාමී ඵලයට පත් වූ කෙනා.
6. අරිහත් මාර්ගයේ පිළිපදින්නා වූ කෙනා.

<u>ඊළඟට ධම්මානුසාරී පුද්ගලයා</u>

''කතමො ච, භික්ඛවෙ, පුග්ගලො ධම්මානුසාරී?	මහණෙනි ධම්මානුසාරී පුද්ගලයන් වහන්සේ කවුද?
ඉධ, භික්ඛවෙ, එකච්චො පුග්ගලො යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ <u>න කායෙන ඵුසිත්වා විහරති</u>,	මේ සාසනයේ සමහර පුද්ගලයන් වහන්සේලා යම් කිසි ශාන්ත විමොක්ෂයක් වේද, රූපයන් ඉක්මවා ගිය අරූපී වූ ධර්ම, නාම කයින් ස්පර්ශ කරමින් වාසය <u>කරන්නේ නෑ</u>.
පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා අපරික්ඛීණා හොන්ති,	ප්‍රඥාවෙන් දැන ආශ්‍රව ක්ෂය කරලා නෑ.
තථාගතප්පවෙදිතා චස්ස ධම්මා පඤ්ඤාය මත්තසො නිජ්ඣානං ඛමන්ති,	තථාගතයන් වහන්සේ දේශනා කළාවූ ධර්මය 'මම කෙසේ හෝ මේ ජීවිතියේදීම සාක්ෂාත් කරනවා,

අපි චස්ස ඉමෙ ධම්මා හොන්ති,	ප්‍රත්‍යක්ෂ කරනවා, අවබෝධ කර ගන්නවා' කියන තද බල හැඟීමෙන් යුක්තව කටයුතු කරනවා.
සෙය්‍යථීදං – සද්ධින්ද්‍රියං, වීරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං. අයං වුච්චති, භික්ඛවෙ, පුග්ගලො ධම්මානුසාරී.	'සද්ධා ඉන්ද්‍රිය' 'වීරිය ඉන්ද්‍රිය' 'සති ඉන්ද්‍රිය' 'සමාධි ඉන්ද්‍රිය' 'ප්‍රඥා ඉන්ද්‍රිය' යන ඉන්ද්‍රිය ධර්ම ධම්මානුසාරීන් වහන්සේට හොඳට තිබෙනවා. (මේ ධම්මානුසාරීන් වහන්සේට ප්‍රඥාව වැඩියි).

ධම්මානුසාරී පුද්ගලයා කෙලෙස් නසපු කෙනෙක් නොවෙයි. මොහු සෝවාන් ඵලයට පත්වෙලා නෑ. නමුත් මේ ජීවිතයේදීම 'මට කෙලෙස් නසන්න පුළුවන්' කියන තද බල විශ්වාසයෙන් කටයුතු කරන කෙනෙක්.

ඊළඟට **සද්ධානුසාරී පුද්ගලයා**. මොහුට සද්ධාව තිබෙනවා. නමුත් මොහුත් කෙලෙස් නසපු කෙනෙක් නොවෙයි. මොහුත් සෝවාන් ඵලයට පත් වූ කෙනෙක් නොවෙයි.

ධම්මානුසාරී පුද්ගලයාත් සද්ධානුසාරී පුද්ගලයාත් දෙන්නාම සෝවාන් ඵලයට පත් වූ අය නොවෙයි. මාර්ගය වැඩීම වශයෙන් ඉන්නා වූ අය. මාර්ගයේ වැඩීම වශයෙන් කියලා කියන්නේ හොඳ විශ්වාසයකින් හොඳ ප්‍රඥාවකින් කටයුතු කරගෙන යනවා, කොහොම හරි මේ ජීවිතයේදී කොයියම් වේලාවක හරි ඒ දෙදෙනා වහන්සේටම ධර්ම අවබෝධ වෙනවා. මේ දෙදෙනාටත් බණ අවශ්‍ය යයි.

1. උභතොභාගවිමුත්ත පුද්ගලයා
2. පඤ්ඤාවිමුත්ත පුද්ගලයා

} මේ දෙනම වහන්සේලා රහතන්වහන්සේලායි

3. කායසක්ඛි පුද්ගලයා
4. දිට්ඨිප්පත්ත පුද්ගලයා
5. සද්ධාවිමුත්ත පුද්ගලයා

} මේ තිදෙනා වහන්සේලා භාගයක් කෙළෙස් නැසූ ස්වාමීන්වහන්සේලා

6. ධම්මානුසාරී පුද්ගලයා
7. සද්ධානුසාරී පුද්ගලයා

} මේ දෙනම වහන්සේලා සෝවාන් මාර්ගයේ ඉන්න ස්වාමීන්වහන්සේලා

මේ සත් දෙනා වහන්සේලාගෙන් රහතන්වහන්සේලා දෙනමට හැර අනෙත් 5 දෙනා වහන්සේලාටම ධර්මය දේශනා කළ යුතුවෙනවා.

ඊළඟට බුදුරජාණන් වහන්සේගේමෙසේ දේශනා කරනවා

''නාහං, භික්ඛවෙ, ආදිකෙනෙව අඤ්ඤාරාධනං වදාමි;	මහණෙනි, මම මහණ වෙච්ච ගමන්ම රහත්වෙන්න ඕන කියලා මුලින්ම රහත් භාවය ප්‍රකශ කරන්නේ නෑ. (ආදිකෙනෙව = එකවරටම, කල් ඇතුවම, මුලින්ම) (අඤ්ඤාරාධනං = රහත් වෙන්න ඕන කියලා කියනේ නෑ)
අපි ච, භික්ඛවෙ, අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා අඤ්ඤාරාධනා හොති.	එසේ වූවත් මහණෙනි ක්‍රමානුකූලව ශික්ෂාවෙන්, ක්‍රියාවෙන්, ප්‍රතිපත්තිය පිරීමෙන් තමයි රහත් භාවය ලබා ගන්නේ.

කථඤ්ච, භික්ඛවෙ, අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා අඤ්ඤාරාධනා හොති?	කොහොමද මහණෙනි ක්‍රමානුකූලව පිළිවෙලින් හික්මීමෙන්, පිළිවෙලින් කටයුතු කිරීමෙන්, පිළිවෙලින් පිළිවෙත් පිරීමමෙන් රහත් වෙන්නේ? (අඤ්ඤාරාධනා = රහත්වීම)
ඉධ, භික්ඛවෙ, සද්ධාජාතො උපසඞ්කමති,	මහණෙනි, ශ්‍රද්ධාව ඇති කෙනා තමයි ස්වාමීන්වහන්සේ කෙනෙක් හෝ ගුරුවරයෙක් හමුවීමට යන්නේ.
උපසඞ්කමන්තො පයිරුපාසති,	පසුව ඔහු ගුරුවරයා ඇසුරු කරන්න පටන් ගන්නවා.
පයිරුපාසන්තොසොතං ඔදහති,	මෙසේ ගුරුවරයා ඇසුරු කරන ඔහුට උන්වහන්සේ කියන දෙයට ඇහුම්කන් දෙන්න ඕන කියලා හිතක් පහළ වෙනවා.
ඔහිතසොතො ධම්මං සුණාති,	මෙසේ කන් යොමු කළාට පස්සේ ධර්මය අහන්න ලැබෙනවා.
සුත්වා ධම්මං ධාරෙති,	මොහු ඒ ඇසූ ධර්මය දරා ගන්නවා.
ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛති,	දරාගත් ධර්මයේ අර්ථ මොහු මෙනෙහි කරනවා.
අත්ථං උපපරික්ඛතො ධම්මා නිජ්ඣානං ඛමන්ති,	ධර්මයේ අර්ථය සළකා බලන ඔහුට එහි තේරුම් දැන ගන්නා වූ නුවණ පහළ වෙනවා.
ධම්මනිජ්ඣානක්ඛන්තියා සති ඡන්දො ජායති,	ධර්ම අවබෝධය ඇතිවෙනකොට ධර්මය පුරුදු කරන්න ඕන කියලා කැමැත්තක් ඇතිවෙනවා.
ඡන්දජාතො උස්සහති, **උස්සාහෙත්වා තුලෙති,**	කැමැත්ත ඇති වූ පසු උත්සාහය කරයි, උත්සාහ කරමින් ඇස කන නාසය නාම රූප ධර්මයන් සියල්ල හොඳට තුලනය කර බලනවා.
තුලයිත්වා පදහති,	මෙසේ තුලනය කොට ස්ථාවර කරගන්නවා.
පහිතත්තො සමානො කායෙන චෙව පරමසච්චං සච්ඡිකරොති,	නුවණින් හොඳට දැනගෙන සත්‍යය ධර්මය නම් වූ නිවන අවබෝධ කර ගන්නවා.
පඤ්ඤාය ච නං අතිවිජ්ඣ පස්සති.	නුවණින් ධර්මය අවබෝධ කරගන්නවා. (නාම කයෙන් ධර්මය අවබෝධ කර ගන්නවා)

දැන් බලන්න මේ කියපු පිළිවෙත. ඉස්සෙල්ලාම මොකක්ද උනේ? පස්සෙම මොකක්ද උනේ? පස්සෙම උනේ නුවණින් ධර්මය දැක අවබෝධ කොටගෙන නිවනට පත් උනා. ඉස්සරවෙලාම කළේ **'සද්ධාජාතො උපසඞ්කමති'** = පළමුවෙන්ම ශ්‍රද්ධාව ඇතිවෙන්න ඕන යම් කිසි තැනකට යන්න. හාමුදරුවෝ කෙනෙක් ගාවට හෝ බණ කියන තැනකට යන්න ශ්‍රද්ධාව තිබෙන්න ඕන. ශ්‍රද්ධාව නැත්නම් ඒක වෙන්නේ නෑ.

ඊළඟට බුදුරජාණන්වහන්සේ මෙසේ ප්‍රකාශ කරනවා.

සාපි නාම, භික්ඛවෙ, සද්ධා නාහොසි; තම්පි නාම, භික්ඛවෙ, උපසඞ්කමනං නාහොසි; සාපි නාම, භික්ඛවෙ, පයිරුපාසනා නාහොසි; තම්පි නාම, භික්ඛවෙ, සොතාවධානං නාහොසි; තම්පි නාම, භික්ඛවෙ, ධම්මස්සවනං නාහොසි; සාපි නාම, භික්ඛවෙ, ධම්මධාරණා නාහොසි; සාපි නාම, භික්ඛවෙ, අත්ථූපපරික්ඛා නාහොසි; සාපි නාම, භික්ඛවෙ, ධම්මනිජ්ඣානක්ඛන්ති නාහොසි; සොපි නාම, භික්ඛවෙ, ඡන්දො නාහොසි; සොපි නාම, භික්ඛවෙ, උස්සාහො නාහොසි; සාපි නාම, භික්ඛවෙ, තුලනා නාහොසි; තම්පි නාම, භික්ඛවෙ, පධානං නාහොසි. විප්පටිපන්නාත්ථ,	ශ්‍රද්ධාව නැත්නම් ධර්මය අහන්න යන්න හිතෙන්නේ නෑ. ගුරුවරයා ආශ්‍රය කරන්නේ නෑ. ධර්මයට කන් යොමුවෙන්නේ වෙන්නේ නෑ, ධර්ම ශ්‍රවණය වෙන්නේ නෑ ධර්මය දැරීමක් වෙන්නේ නෑ ධර්මයෙහි අර්ථය සලකා බැලීමක් වෙන්නේ නෑ ධර්මය වටහා ගැනීමට නුවණක් පහළ වෙන්නේ නෑ එම නිසා කැමැත්තක් ඇති වෙන්නේ නෑ කැමැත්තක් නැති නිසා උත්සාහයක් කරන්නේ නෑ නාම රූප ධර්ම තුලනය කිරීමක් වෙන්නේ නෑ තුලනය කොට ස්ථාවර කිරීමක් වෙන්නේ නෑ ඒක නිසා ප්‍රතිපදාවක යෙදෙන්නේ නෑ.

නැවත බුදුරජාණන් වහන්සේ අස්සජි පුනබ්බසුක දෙන්නා පෙන්නලා මෙසේ දේශනා කරනවා

භික්ඛවෙ, මිච්ඡාපටිපන්නාත්ථ, භික්ඛවෙ. කීව දූරෙවිමෙ, භික්ඛවෙ, මොඝපුරිසා අපක්කන්තා ඉමම්හා ධම්මවිනයා.	මහණෙනි, බලන්න මේ හිස් මොඝ පුරුෂයන් දෙන්නා ධර්මයෙන් කොච්චර ඈතට ගියාද කියලා ප්‍රකාශ කරනවා.

මේ දෙදෙනා ගරු කළේ ආමිසයද ධර්මයද? ආමිසය ගරු කළේ. බුදුරජාණන්වහන්සේ මේ කථාව භික්ෂූන්වහන්සේලාට දේශනා කරනවා. මේකට හේතු උනේ අස්සජි පුනබ්බසුක යන භික්ෂූන්වහන්සේලා දෙදෙනා. මේ සූත්‍ර දේශනාව කළේ කීටාගිරියේ ඉඳලා.

හොඳයි සැම දෙනාටම සුවසේ ධර්ම අවබෝධය සිද්ධ වේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා! තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!



ඉහත සඳහන් ධර්ම දේශනාව අති පූජ්‍ය හත්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.